රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

**SLS 22623 – සිංහල ගද්‍ය සාහිත්‍යය II**
**(ගම්පොල සිට මහනුවර තෙක් සිංහල ගද්‍ය)**

<u>පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය.

කාලය : පැය 03

---

01. පහත දැක්වෙන ගද්‍ය පාඨවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ).

එ කලැ බුදුහු සක්දෙව් රජහුගේ පූර්වචරිතය බලා ශක්‍රය, ආයු බොහෝ වේව සිං වදාලසේක. එ බස හා සමග ශක්‍රයෝ තුන්කෙල සැටලක්‍ෂයක් අවුරුද්දකට ආයු ලදින් තුන්ගව් උස දිව්‍යශරීර ඇති ව ගව් උස මිණි ඔටුනු බරං සැටගැලක් පුරලන දිව්‍යාභරණයෙන් සැරැහී රන්ගිරිකුළුදෙකක් බඳු වූ දිවමිණිකොඩොල් දෙකක් දෙකනැ පැළැඳ යෙලයාලක් සුවඳ විලවුන් ගෙන රන්ගිරි අතලක් මුදුනෙත් හුණු ගඟුල්හැල්ලක් හා සමාන වූ මනහරමුත්හරක් කර ලා විදුලියකැලවැළැඳි රත්පඬිතයක් මෙන් ශොභාවත් ව නොයෙක් දහස් සුවහස් ගණන් හිරසඳ එකවිටැ පහළ වූ කලක් පරිද්දෙන් සියලඟින් දිවත්නාවූ රශ්මිසමූහයෙන් දසදික් හොබවා මහත් වූ දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහී වැඳ වැඳ නැඟී සිට බුදුන්ගේ මහිම සිතසිතා වැඳ වැඳ නැමිනැමී එකත්පස් ව සිටියහ.

මෙසේ මහසොම්නසින් ඔදවැඩියා වූ ශක්‍රයෝ බුදුන්ට දන්වන්නාහු සවාමීනි, පෙර මම මේ බුද්ධොත්පාදයෙහි ම සදිව්‍යලෝකය පිරෙයි, සතර අපාය සිස් වෙයි යනු අනුන් අතින් ඇසීමි, දැන් මම ඒ ප්‍රත්‍යක්‍ෂයෙන් ම දිටිමි.

(සද්ධර්මාලංකාරය,සංස්,බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය)

(ආ)

– ඉක්බිති, හැමට බාල වූ **ගොඨාභය** කුමාර තෙමේ, "මොහු දෙදෙන ම සවල්ප වූ ආයුෂ ඇත්තාහු ය, රාජ්‍යයෙහි පිහිටියාහු ද, බොහෝ කලක් ජීවත් නො වෙත් ල එ හෙයින් මම් ම මොවුනට රාජ්‍යය දෙවමි" යි රාජ්‍ය ලාභයට සුදුසු වූ උපායයන් පිළිපදනේ, ඔවුනට රාජ්‍යලාභය පිණිස උපායය දක්වන්නේ, එකාවන් ව මන්ත්‍රණය කෙරේ. වැඩි මහලු වූ සඞඝතිස්ස කුමාර ද, ඒ **ගොඨාභය** කුමාරයන් විසින් දක්වන ලද උපදෙශයෙහි හැසිරෙන්නේ, එ නුවර රජ්පුරුවන් දක ගෙන ලබන ලද සම්මාන ඇත්තේ, සියලු රාජකටයුත්තෙහි පෙරදැරි ව, නොබෝ කලෙකින් ම රජහට වල්ලභ වූයේ යි. එ සමයෙහි රාජ්‍යය කරන්නා වූ විජයරාජ නම් ක්‍ෂත්‍රිය රජ තෙමේ, ඒ සඞඝතිස්ස කුමාරයන් කෙරෙහි ප්‍රසන්න වූයේ, සියලු රාජ කටයුත්තෙහි සඞඝතිස්ස කුමාරයන් ම ප්‍රධාන කොට, සෙනෙවිරත් තනතුරට පැමිණවූයේය

(එළු අත්තනගලු වංසය,සංස්,කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි)



117

(ඇ)

එසේ ම අවස්ථිත සමාදානයෙහි කායසුචරිතයෙහි වචීසුචරිතයෙහි මනොසුචරිතයෙහි දානසංවිභාගයෙහි ශීලසමාදානයෙහි උපවසථොපවාසයෙහි[1] මාතෘතායතායෙහි පෛතෘතායතායෙහි ශ්‍රාමණ්‍යතායෙහි බ්‍රාහ්මණ්‍යතායෙහි කුලජ්‍යෙෂ්ඨාපචායිතායෙහි ද, අන්‍යතර අධිකුශලධර්මයෙහි ද, සතරාමර ලොකයා විසින් නොසෙල්විය හැකි පරිද්දෙන් දෘඪ වූ සමාදාන ය ඇතිවූ සේක. ඒ කුශල කර්මය හේතුකොටගෙණ කාලුත් මරණින් මත්තෙහි ස්වර්ගයෙහි ඉපද එහි දිව්‍ය වූ ආයුෂයෙන් දිව්‍ය වූ වර්ණයෙන් දිව්‍ය වූ සැපයෙන් දිව්‍ය වූ යසසින් දිව්‍ය වූ ආධිපත්‍යයෙන් දිව්‍ය වූ රූපයෙන් දිව්‍ය වූ ශබ්දයෙන් දිව්‍ය වූ ගන්ධයෙන් දිව්‍ය වූ රසයෙන් දිව්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් සුයෙසාදයෙහි බඳ්ධෛතකාමීන් සෙයින් සෙසු දෙවියන් මැඩපවත්වමින් ස්වර්ග සම්පත් විඳ එයින් චුත ව වැඩිසේක් මෙ සමයෙහි සුප්‍රතිෂ්ඨිත පාදතලද්වය ඇති වූ සේක.

(සද්ධර්ම සාරාර්ථ සංග්‍රහය,සංස්, කිරිඇල්ලේ ඥාණවිමල හිමි)

(ඇ)

ඒ බුදුසස්නෙහිදී පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකොට මනාකොට කරණ ලද ඒ කුශල කර්මයෙන් තව්තිසා දෙව්ලොව ඉපදීම් වශයෙන් ගියෙමි, එහි මට උතුම්වූ කූටාගාරයෙන් යුක්තවූ මහාසයනයෙන් හැරහුනාවූ යොදනක් පමණ උස ඇති විමානයෙක් පහල වූයේය, හැම කල්හිම ලක්‍ෂයක් දෙවඟනෝ මා පිරිවරා මට උපස්ථාන කෙරෙති හැම කල්හිම තොපු දෙවියන් අබිබවා බබලන්නෙමි, සූසැටක් පමණ දෙව් රජුන්ට අග්‍රමහිෂිකා බවට පැමිණියෙමි, තෙසැටක් පමණ සක්විති මහ රජවරුන්ට අගමෙහෙසුන් බවට පැමිණියෙමි, උපනුපන් තන්හි ස්වර්ණ වර්ණව හැසුරුනෙමි, හැමතන්හිම සියල්ලන්ට උතුම්වීමි, මේ පෙහෙවස් සමාදන් වීමෙහි ඵලනම් වන්නේය, හස්ත්‍යස්වරථ යානාවන් යන මේ සියල්ලද ලැබුයෙමි, මේ පෙහෙවස් සමාදන් වීමෙහි ඵල නම් වන්නේය, ස්වර්ණමයවූද රජතමයවූද ඵලිකමයවූද ලෝහිතඞ්කමයවූද, මේ ආභරණ භාණ්ඩ සියල්ලම ලැබුයෙමි

(සිංහල උපාසක ජනාලංකාරය,සංස්,ඩී.පී.ආර්.සමරනායක)

(ලකුණු 20 යි.)

2. "ශ්‍රාවක පොදුජනයාට මහඟු ගුණධර්ම පෙන්වා දීම සද්ධර්මාලංකාරය ලිවීමේ එක් පරමාර්ථයකි." පහදන්න.

3. "පාලි කෘතියක් ආශ්‍රයෙන් රචනා වුව ද එළු අත්තනගලු වංශයෙහි වාක් කෝෂය සංස්කෘතයට නැකම් කියයි." මේ ප්‍රකාශයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

4. සාමාන්‍ය ජනයාගේ අවබෝධය පිණිස ධර්ම කරුණු පැහැදිළි කිරීම සඳහා සද්ධර්ම සාරාර්ථ සංග්‍රහයෙහි භාවිත රචනා උපක්‍රම පිළිබඳ විමසීමක යෙදෙන්න.

5. සිංහල උපාසක ජනාලංකාරය ධර්ම ග්‍රන්ථයක් මෙන්ම සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස ද සැළකිය හැකිදැයි සාකච්ඡා කරන්න.

6. "පාලි ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කිරීම ගම්පොල යුගයේ සිට මහනුවර යුගය තෙක් සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි දිස්වන ප්‍රවණතාවක් වුව ද එකිනෙක කතුවරුන් විවිධ පරිවර්තන ක්‍රමවේද අනුගමනය කළ බව පෙනේ." අභිමත කෘති දෙකක්වත් ආශ්‍රය කර ගනිමින් විමර්ශනයක යෙදෙන්න.

7. "සංඝරාජ සාධු චර්යාව සරණංකර හිමියන්ගේ පරමාර්ථ සාධනයෙහි ලා පැවති අප්‍රතිහත ධෛර්යයත් නොසැලෙන අධිෂ්ඨානයත් පිළිබිඹු කෙරෙන චරිත කථාවකි." නිදසුන් සහිත ව විස්තර කරන්න.

(අංක 02 – 07 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගිනි)

@@@@@@@@@@@@@@@@